JMC vLearning
"your virtual learning partner"

# අසම්පූර්ණ වාර්තා මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

## AAT අදියර II
## AFC - උසස් මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැයකරණය


රුක්මල් විජේකෝන්
MAAT, ACMA, CA Finalist



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

පරිච්ඡේදය

06

# අසම්පූර්ණ සටහන් වලින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීම

උපයෝගි පොත්, ලෙජරය හා ශේෂ පිරික්සුමක් ඇසුරෙන් අවසන් ගිණුම් පිළියෙල කළ ආකාරයයි. කෙසේ වෙතත් සමහර ව්‍යාපාරවල එවැනි විධිමත් ගිණුම් වර්තා කිරීමේ ක්‍රියාපටිපාටියක් දැකිය නොහැක. එවැනි ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ක්‍රියාකාරිත්වය මැනීම සඳහා අපට අවසන් ගිණුම් පිළියෙල කළ යුතුය. මේ සඳහා ප්‍රධාන ක්‍රම දෙකක් භාවිතා කළ හැක.

01. තනි සටහන් මඟින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීම.
02. ලාභ සමීකරණ ඇසුරෙන් ලාභය තීරණය කිරීම.

## තනි සටහන් මගින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීම

බොහෝ ව්‍යාපාර අවම වශයෙන් පහත ගිණුම් වාර්තා පවත්වා ගෙනයයි.

- යම් දිනකට පවතින වත්කම් හා වගකීම් ප්‍රමාණය.
- ණයට විකුණුම් ප්‍රමාණය සහ ණයගැතියන්ගෙන් ලද මුදල් ප්‍රමාණය.
- ණයට ගැණුම් ප්‍රමාණය හා ණයහිමියන්ට ගෙවූ මුදල් ප්‍රමාණය.
- කාලපරිච්ඡේදයේ මුදලින් කළ වියදම් ප්‍රමාණය

ඉහත සඳහන් ගිණුම් වාර්තා භාවිතා කොට මූල්‍ය වාර්තා පිළියෙල කිරීම පිළිබඳව අප දැන් අධ්‍යයනය කරමු.

මේ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

**පියවර (I)**
කාලපරිච්ඡේදය අවසන් දිනට පවතින වත්කම් සහ වගකීම් මගින් ශේෂ පත්‍රය පිළියෙල කර ගන්න. ඊට පසුව අවශ්‍ය වන්නේ වසරේ ශුද්ධ ලාභය / අලාභය ගණනය කිරීමයි.

**පියවර (II)**
කාලපරිච්ඡේදයේ ණයගැති පාලන ගිණුම ඇසුරෙන් **"විකුණුම්"** වටිනාකම ගණනය කරන්න.

මෙම විකුණුම් වටිනාකම වෙළඳ ගිණුමට ගෙන යන්න. →

**ණයගැති පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය | XXX | මුදල් ලැබීම් | XXX |
| විකුණුම් | XXX | | |
| | | ප/ගෙ/ශේෂය | XXX |
| | XXX | | XXX |

JMC vLearning "your virtual learning partner"

**පියවර (III)**

කාලපරිච්ඡේදයේ ණයහිමි පාලන ගිණුම ඇසුරෙන් **"ගැණුම්"** වටිනාකම ගණනය කරන්න.

**ණයහිමි පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| මුදල් ගෙවීම් | XXX | ශේෂය | XXX |
| | | ගැණුම් | XXX |
| ප/ගෙ/ශේෂය | XXX | | |
| | XXX | | XXX |

මෙම ගැණුම් වටිනාකම ද වෙළඳ ගිණුමට ගෙන යන්න.

**පියවර (IV)**

මුදල් පොතේ මුදලින් කළ සියලුම වියදම් ලාභාලාභ ගිණුමට ගෙනයන්න. කාලපරිච්ඡේදය අවසන් වන විට හිඟ වියදම් ශේෂයක් ඇත්නම් එයද ලාභලාභ ගිණුමට ගෙනයන්න.

**සැ.යු:** තනි සටහන් ඇසුරෙන් අවසන් ගිණුම පිළියෙල කළද ද්විත්ව සටහන් ක්‍රමය පදනම් කරගත යුතු වේ.

## උදාහරණ - 14

2021.03.28 දින හටගත් ගින්නකින් B සමාගමේ පොත් තැබීමේ ඇතැම් වාර්තා විනාශයට පත් විය. කෙසේ වුවද 2021 මාර්තු 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා, පහත සඳහන් තොරතුරු රැස්කර ගැනීමට එහි පොත් තබන්නා සමත් වී ඇත.

(1) **ලැබීම් හා ගෙවීම්** රු.

| | |
|---|---|
| වර්ෂය තුළ ගණුදෙනුකරුවන්ගෙන් ලද මුළු මුදල | 4,580,000 |
| වර්ෂය තුළ සැපයුම්කරුවන්ට ගෙවූ මුළු මුදල | 2,710,000 |
| වියදම් වෙනුවෙන් ගෙවූ මුළු මුදල | 870,000 |

(2) **ලැබිය යුතු වෙළෙඳ ණය** රු.

| | |
|---|---|
| 2020.04.01 දින ආරම්භක ශේෂය | 312,000 |
| 2021.03.31 අවසාන ශේෂය | 342,000 |
| විකුණුම් ආපසු එවුම් | 48,700 |
| දුන් වට්ටම් | 15,800 |
| බොල් ණය | 14,100 |

(3) **ගෙවිය යුතු වෙළෙඳ ණය** රු.

| | |
|---|---|
| 2020.04.01 දින ආරම්භක ශේෂය | 281,200 |
| 2021.03.31 දින අවසන් ශේෂය | 264,800 |
| ගැණුම් ආපසු යැවුම් | 12,310 |
| ලද වට්ටම් | 13,640 |

(4) **තොග**

| | |
|---|---|
| 2020.04.01 දිනට ආරම්භක තොගය | 310,600 |
| 2021.03.31 දිනට අවසන් තොගය | 284,200 |

JMC vLearning "your virtual learning partner"

(5) රු.

| | |
|---|---|
| 2021.03.31 දිනට උපචිත වියදම් | 48,800 |

**ඔබ විසින්,** පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

(a) 2020/2021 වර්ෂය සඳහා ලැබිය යුතු වෙළෙඳ ණය පාලන ගිණුම හා ගෙවිය යුතු වෙළෙඳ ණය පාලන ගිණුම **(ලකුණු 04)**

(b) ලබා ගැනීමට ඇති තොරතුරු වලින්, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ ආදායම් ප්‍රකාශය **(ලකුණු 04)**

## *උදාහරණ - 15*

(A) **සේනක** තම ව්‍යාපාරය සඳහා විධිමත් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඔහු පහත දක්වන තොරතුරු වලින් 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීම පිණිස ඔබගේ සහාය අපේක්ෂා කරයි.

(1) වත්කම් සහ වගකීම් ශේෂයන්:

| | 2019.12.31 දිනට රු. | 2020.12.31 දිනට රු. |
|---|---|---|
| බඩු තොග | 300,000 | 420,000 |
| බැංකුවේ ඇති මුදල් | 180,000 | - |
| බැංකු අයිරාව | - | 30,000 |
| ලැබිය යුතු ගිණුම් - වෙළෙඳ | 330,000 | 540,000 |
| ගෙවිය යුතු ගිණුම් - වෙළෙඳ | 390,000 | 510,000 |

(2) වර්ෂය තුළ කරන ලද මුළු චෙක්පත් ගෙවීම්:
- (i) කාර්යාල උපකරණ සඳහා රු. 330,000/-
- (ii) ගෙවිය යුතු ගිණුම්, වෙළෙඳ රු. 2,112,000/-
- (iii) මෙහෙයුම් වියදම් රු. 495,000/-

(3) අමතර ප්‍රාග්ධනය වශයෙන් සේනක රු. 150,000/- ක් බැංකු ගිණුමේ තැන්පත් කර ඇත.

(4) ලැබිය යුතු ගිණුම් වෙළෙඳ සඳහා වර්ෂය තුළදී දෙන ලද වට්ටම් රු. 45,000/- ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් වෙළෙඳ වලින් ලැබුණු වට්ටම් රු. 30,000/- ක් විය. රු. 21,000/- ක් අයවිය යුතුව තිබූ ලැබිය යුතු ගිණුම් වෙළෙඳ ගණුදෙනුකරුවෙකු බුංවත් වී ඇත.

(5) සියළුම ලැබීම් සහ ගෙවීම් බැංකු ගිණුම මඟින් සිදුකර ඇතැයි උපකල්පනය කරන්න.

**ඔබ විසින්, පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.**

උක්ත තොරතුරු පදනම් කරගෙන **සේනකගේ** ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභා'ලාභ ගිණුම. **(ලකුණු 08)**

JMC vLearning "your virtual learning partner"

# ලාභ සමීකරණය ඇසුරෙන් මූල්‍ය වාර්තා පිළියෙල කිරීම

**පියවර (I)**
කාලපරිච්ඡේදය අවසන දිනට ඇති වත්කම් හා වගකීම් වලින් ශේෂ පත්‍රය පිළියෙල කිරීම.

**පියවර (II)**
වර්ෂයේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා ලාභ සමීකරණය යෙදීම.

❖ **ලාභ සමීකරණය**

ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය හා වර්ෂ අවසානයේ ඇති ප්‍රාග්ධනය අතර වෙනසට බලපානු ලබන හේතූන් විමසුවහොත් ඔබගේ පිළිතුර කුමක් වේද?

| | |
|---|---|
| ආරම්භක ශේෂය | XXX |
| (+) අමතර ප්‍රාග්ධනය | XXX |
| | XXX |
| (+) ශුද්ධ ලාභය | XXX |
| | XXX |
| (-) ගැනිලි | (XXX) |
| අවසන් ප්‍රාග්ධනය | XXX |

මෙය සමීකරණයක් ලෙස ප්‍රකාශ කළහොත්,

**ආරම්භක ප්‍රාග්ධනය + අමතර ප්‍රාග්ධනය + ශුද්ධ ලාභය - ගැනිලි = අවසන් ප්‍රාග්ධනය**

දැන් ශුද්ධ ලාභය උක්ත කරගන්න, එවිට ලාභ සමීකරණය පහත පරිදි දැක්විය හැකිය.

**ශුද්ධ ලාභය = අවසන් ප්‍රාග්ධනය - ආරම්භක ප්‍රාග්ධනය + ගැනිලි - අමතර ප්‍රාග්ධනය**

❖ **විකල්ප ක්‍රමය (Alternate Method)**

ශේෂ පත්‍ර සමීකරණය ඇසුරෙන් ප්‍රාග්ධනය පහත පරිදි ප්‍රකාශ කළ හැක.

**ප්‍රාග්ධනය = වත්කම් - වගකීම්**

එනම්, ප්‍රාග්ධනය = ශුද්ධ වත්කම්

**ශුද්ධ ලාභය = අවසන් ශුද්ධ වත්කම - ආරම්භක ශුද්ධ වත්කම + ගැනිලි - අමතර ප්‍රාග්ධනය**

JMC vLearning "your virtual learning partner"

## උදාහරණ - 16

දේශානි රු. 500,000/- ක ප්‍රාග්ධනයක් යොදා 2020.04.01 දින ව්‍යාපාරයේ ආරම්භ කළාය. 2021.03.31 දින දී ව්‍යාපාරයේ මුළු වත්කම් හා වගකීම්වල අගය පිළිවෙලින් රු. 800,000/- ක් හා රු. 100,000/- කි. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් අනුව රු. 230,000/- ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කෙරුණි නම් පහත සඳහන් ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) දේශානි විසින් වර්ෂය තුළ රු. 200,000/- අතිරේක ප්‍රාග්ධනයක් යොදවා ඇත.
(2) වර්ෂය සඳහා දේශානිගේ ගැනිලි රු. 30,000/- කි.
(3) වර්ෂය සඳහා ලාභය රු. 300,000/- කි.
(4) වර්ෂය තුළ දේශානි රු. 70,000/- ක අතිරේක ප්‍රාග්ධනයක් යොදවා ඇත.

**(ලකුණු 02)**

## උදාහරණ - 17

පහත තොරතුරු, තනි වෙළෙන්දෙකුගේ ව්‍යාපාරයකට අදාළ වේ.

| | (රු.) |
|---|---|
| 2020.04.01 දිනට ශුද්ධ වත්කම් | 465,000 |
| 2021.03.31 දිනට ශුද්ධ වත්කම් | 685,000 |
| 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ: | |
| - වෙළෙන්දාගේ ගැනිලි මුදලින් | 170,000 |
| - වෙළෙන්දා යෙදවූ අමතර ප්‍රාග්ධනය | 125,000 |
| - ව්‍යාපාරයට සම්බන්ධ නොවූ වෙළෙන්දාගේ බිරිඳගේ වෛද්‍ය බිල් ගෙවීම සඳහා යෙදූ ව්‍යාපාරයේ මුදල්, | 50,000 |

උක්ත තොරතුරු අනුව, තනි වෙළෙන්දාගේ වසර සඳහා ලාභය වනුයේ:

(1) රු. 125,000 (2) රු. 215,000 (3) රු. 315,000 (4) රු. 225,000

**(ලකුණු 02)**

JMC vLearning "your virtual learning partner"